## අභිමි වන පෙම

දුකට ගැයූ කවි ගී හද     තලාවේ
හිරුට සඳුට කාටත්     නෑසුණාවේ
අහස කළු කරන් එන වැහි     වලාවේ
මේ සෝ දුක් වැහි දියට ම     වුණාවේ

ඔබ ම පතා සංසාරේ හිඳ     පැමිණි
යශෝධරා වෙමි ඉපැදුණු ඔබ     නමිනි
නමුදු ඒ තරම් බෑ උහුලන්න     ගිනි
මන්ද මෙමා පින්වතියක් නො ව     එවැනි

යශෝධරා සිදුහත් අත් හැරි     විලස
මට හැකි නොවේ නුඹ අත් හරිනට     විගස
සසරින් බැඳුණු බැමි මා සිඳ ලනු     කෙලෙස
කියා නොදී නොම යන් මා හැර     මෙලෙස

වැහි පොද වැනිය ගලනා මේ කඳුළු     පිනි
පිසලන සැණින් යළි තෙත් වෙයි ඇස්     කෙවෙනි
සදහට කඳුළු නවතින දින මා     නොදනී
ඒ බව හොඳින් දන්නේ නම් ඔබ     පමණි

පන්හිඳ පුරා හැඟුමන් දැවටෙමින්     නිති
පත් ඉරු වටා බිහි වෙයි කවි මල්     කිනිති
රඳවා ගන්න පපුතුර තුළ ඉඩක්     නැති
මහමෙර ලෙසින් වූ පෙම තව නුඹට     ඇති

ජී.එම්.පී. විරාෂා ගොඩකන්ද
දෙවන වසර
සමාජ විද්‍යා අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය
pavani.17125@uhss.ruh.ac.lk

9 772950 655005